පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 11 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- ක්‍රිස්තියානි ධර්මය

පාසලේ නම : ...........................................

ඇතුළත්වීමේ අංකය : ...........................

කාලය : පැය 3 වි 10

**උපදේස් :- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න .මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ. අංක 01- 40 තෙක් ප්‍රශ්න වල දි ඇති 1,2,3,4 පිළිතුරු වලින් වඩාත් නිවැරදි හෝ ගැලපෙන පිළිතුර තොරන්න..**

## I කොටස

01) කිතු උපත පිළිබඳ දිවැස් වැකි පැවසු දිවැසිවරයා වන්නේ,

i. ජේරමියා ය. ii . එසකියෙල් ය. iii . එළියා ය. iv . යෙසායා ය.

02) දෙවි සමිදාණන් සිය සෙනග බලා කරුණාවෙන් විමුක්තිය සලසා දුන් බැවින් **ඒතුමන්ට තුති පැසසුම් වේවා** මෙය පැවසුවේ.

i .පූජක සෙකරියස් ය. ii .මරිය තුමි ය

iii ස්නාවන යොහාන් තුමා ය. iv.ගාබ්‍රියෙල් දේව දූතයා ය.

03) දෙවියන් වහන්සේට ගෞරවය, පක්ෂපාතිත්වය හා කීරුකම ප්‍රකාශ වන අවස්ථාවකි.

i .චර්මඡ්ජේදන උත්සවය ii . කැපකිරීමේ උත්සවය

iii .පාස්කු උත්සවය iv .පෙන්තකොස්ත මංගල්‍ය ය.

04. ක්‍රිස්තුස් වහන්සේ තම ප්‍රඥව ප්‍රකාශ කළේ ,

i .වතුර වයින් කිරිමේදි ii .පරික්ෂාවන්ට මුහුණ දිමේදි

iii .අධිරාජයාට බදු ගෙවිම පිළිබද ප්‍රශ්නයට පිළිතුරු දිමේදි. iv. ශ්‍රාවකයන් තේරිමේදි

05)ආනා දිවැසිවරිය කාගේ දියණියද?

i .දාවිත් ගේ ii . අභියාගේ iii .එම්මානුවෙල් ගේ iv .ගමාලියෙල් ගේ

06) ජේසුස් වහන්සේ ගේ සේවයේ අරමුණ ප්‍රකාශ වුයේ.

i .නාසරෙත් ධර්මශාලාවේ දේශනයෙනි. ii .මිටියාවතේ දේශනයෙනි.

iii .ශ්‍රාවකයන් කැඳවිමෙනි iv. රූප විපාර්යාසයෙන්

07) 'මව්කුස සිටම ඔහු ශුද්ධාත්මයෙනී පූර්ණ වන්නේය." මෙසේ පවසන ලද්දේ.

i ගාබ්‍රියෙල් දේවදූතයා විසින් මරිය තුමියට ii .සිමියොන් විසින් මරිය තුමියට

iii .සෙකරියස්ගේ ගීතයේ කොටසකි iv.හාබ්‍රියෙල් දේවදූතයා සෙකරියස්ටය.

08) ජේසුස් වහන්සේ පරිසිවරුන්ට අවධාරණය කිරිමට උත්සහා දැරු සත්‍යතාව වුයේ,

i .ප්‍රේමයේ පදනම මත පිහිටා කටයුතු කිරිමයි

ii .අන් අයගෙන් වෙන් වි දිවිගෙවිමේ වැදගත්කමයි

iii . බාහිර පවිත්‍රතාවය පවත්වා ගැනිමේ අවශ්‍යතාවයයි.

iv . කථාව හා සංවාදය තුලින් නීති රීති එළි දැක්වීමේ වැදගත් කමයි.

09)පහත සඳහන් වන්නේ ජේසුස් වහන්සේ විසින් ඉගැන්වූ උපමා කිහිපයකි

A- රන් කාසි දහය පිලිබඳ උපමාව B- යහපත් සාමාරිතයා පිලිබඳ උපමාව

C- වංචනික ගබඩා කාරයා පිලිබඳ උපමාව D- නැතිවූ බැටළුවා පිලිබඳ උපමාව

ඒ අතරින් දේව රාජයේ පුරවැසියන් ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුතුව ක්‍රියා කළයුතු බව හා විශ්වාසවන්ත විය යුතු බව උගන්වන උපමා වන්නේ,

i . A හා B ය. ii. B හා D ය. iii.C හා A ය. iv. D හා C ය.

10)ක්‍රිස්තුස් වහන්සේගේ අණට කීකරු වීම තුළින් ලැබූ අත්දැකීම හේතු කොට ගෙන සිමෝන් අවබෝධකර ගත්තේ,

i.උසස් පුද්ගලයෙකු ඉදිරියේ තමාගේ නොවටිනා ස්වභාවයයි.

ii. තමා ඇසූ වචන වල බලගතු ස්වාභාවයයි.

iii. තම ජීවිතය තුළ නිදන්ගතවූ පවුකාර ස්වභාවයයි.

iv. තම ජීවන වෘත්තිය තුළ වූ අවේගශීලී ස්වභාවයයි.

11. දුක ඉසිලූ සේවකයාණෝ, දුක් පීඩා දරාගෙන තම දිවි පූජා කළේ,

i. විනාශ වූ දෙවි මිනිස් සබඳතාවය යළි ස්ථාපිත කිරීමටය

ii. මානව වර්ගයාගේ, පාපයට ගෙවිය නොහැකි වන්දිය ගෙවීමටය

iii. මානව වර්ගයාට ඇති අසීමිත ප්‍රේමය අනාවරණය කිරීමටය

iv. දේව ප්‍රකාශනයන් වල ඉදිරිපත් වූ දිවැස් වැකි සම්පූර්ණ කිරීමටය.

12. "අනුන් ඔබට යමක් කරනවාට ඔබ කැමැත්ත හුද............." යේසුස් වහන්සේ ඔබට දුන් රන් අණට ඔබගේ ප්‍රතිචාරය විය යුත්තේ,

i. හදවතින්ම ඔහුට ස්තුති ප්‍රසංසා කිරීමටය

ii. එම ක්‍රියාව ගැන දේවාශිර්වාද පැතිමය

iii. ඔබ විසින් ඔවුන්ට ඒ දේම කිරිමටය.

iv. ඔබ ලත් දේ මෙන් දෙගුණයක් ඔහුට ගෙවිමටය.

13) ධනවත් අයකැමියාගේ සිතැගි බලාපොරොත්තු ක්ෂණිකව ඉටු වුයේ.

i.ජේසුස් වහන්සේ ,ඔහුගේ නමින් ආමන්ත්‍රණය කළ මොහොතේදිය.

ii.ජේසුස් වහන්සේ ,ඔහුගෙ නිවසට පැමිණෙන බව පැවසු මොහොතේදිය.

iii.ජේසුස් වහන්සේ තමා ඉදිරියට ඔහුව කැඳවාගත් මොහොතේදිය.

iv.ජේසුස් වහන්සේ ,ඔහුට දුන් පොරොන්දු ඉටු කළ මොහොතේදිය.

14)මොලොව ඥානයෙන් විසදිය නොහැකි සියල්ලෙහි ,දෙවිඳුන්ගේ ආශ්චර්යමත් ක්‍රියා අත්විදිය හැකි වන්නේ,

i.වර්තමානයේ අනාගත වාක්‍ය වදාරන . අයගේ තිරණ පැතිමෙනි.

ii.තම ප්‍රබල යැදුම් තුළ දේව අභිමතය අවබෝධ කරගැනිමෙනි.

iii.තමාගේ යහපත එළිදරව් වනතුරු ඉවසිල්ලෙන් බලා සිටිමෙනි.

iv.ශුද්ධ ලියවිලි පරික්ෂා කරමින් දේව පොරොන්දු විමසිමෙනි

15) විමුක්තියේ ක්‍රියාවලිය ව්‍යර්ථ කිරිමට එල්ලවූ ප්‍රබල පරික්ෂාව වුයේ ,

i.වීරත්වය විදහා පෑමට පාළුකරයේදි ලත් යෝජනාව ය.

ii.දෙවිදුගේ ක්‍රිස්තුස්ට ප්‍රධානින් කළ ගැරහුම්ය

iii.කුරුසයේ එල්ලි සිටි වරදකරුවා කළ ගලවා ගැනිමේ යෝජනාව ය.

iv.යුදෙව්වන්ගේ රජුට කාඩි පිළිගැන්වූ සෙබලන්ගේ සරදම්ය.

16) "මම ස්ත්‍රියක විවාහ කර ගතිමි එබැවින් එන්නට නොහැකිය" . මෙම වගන්තියේ සත්‍යතාවය නම් ,

i.දේව ආරාධනාව ප්‍රතික්ෂේප කරන සියල්ලන්ට සදාකාලිකව දේව රාජ්‍ය අහිමි වන බව් ය.

ii.සත්‍යය අවබෝධය තහවුරු විමය

iii.සියලු බාධක ඉවත් කර පිහිට විය යුතු බවය

iv.සුදානම, ඉවසිල්ල තුළින් දේව රාජ්‍යයේ කටයුතු වල නිරත විය යුතු බවයි.

17) දිව්‍ය එඬේරාණෝ හා තම බැටළුවන් අතර පවතින සුහද සැබැදියාව මින් ගම්‍ය වේ .

i.බැටළුවන්ගේ කායික අවශ්‍යතා සැපයීම නිසාය
ii.බැටළුවන්ගේ ජීවිත සතුරු ප්‍රහාරයන්ගෙන් සුරැකීම නිසාය.
iii.එඬේරාණන්ගේ මඟ පෙන්වීම අනුව බැටළුවන් ක්‍රියාකාරී වීම නිසාය .
iv.දෙපාර්ශවය අතර නිරන්තර සන්නිවේදන පැවතීම නිසාය

18)ජෝබ්ගේ ආදර්ශය අනුව දරාගත නොහැකි පීඩා හමුවෙහි නොසැලී සිටීමට අත්‍යවශ්‍ය ක්‍රියාමර්ග වන්නේ,

i. දේව ගරුබිය පාමින් , සියලුම දේව ආඥා ආරක්ෂා කිරීමටය.
ii. පෙළඹවීම මත වඩා බලවත් දෙවිවරුන්ගේ සරණ පැතීමය.
iii. දේව ඇදහිල්ලේ ස්ථාවරය මත විශ්වාස වන්තව කීකරු වීමය.
iv. පීඩා ගිනිදැල් නිවී යනතුරු සිත එකඟ කරගෙන යාච්ඤා කිරීමය.

19. දේව පණිවිඩය එළිදරව් කිරීමෙන් මරණ මංචකය හිමි වූ දිවැසිවර ජෙරමියාගෙන් අද අප ලබන මග පෙන්වීම වන්නේ.

i. සේවය තුල ලැබෙන පීඩා ඉවසිල්ලෙන් දරා ගැනීමේදී දෙවිදුන් සුදුසු ලෙස ක්‍රියා කරන බවය.
ii.පීඩා හමුවේ බලාපොරොත්තුවෙන් යාච්ඤාවේ යෙදිය යුතු බවය.
iii. දුක් වේදනා දරුණු වූ විට දෙවිදුන්ගෙන් ඊට හේතු විමසිය යුතු බවය.
iv. දුක් විදි සේවකයා ගැන මෙනෙහි කරමින් තමාගේ මිදීම ගැන යැදිය යුතු බවය.

20. දේව රාජ්‍යයේ ඉගැන්වීමට අනුව අවංක අසල් වැසියා යනු,

i. යුද්ධයේදී අංගවිකල වී කළකිරී සිටින සෙබලෙකුට උපදේශන පවත්වන්නෙකි.
ii. වැඩිහිටි නිවසක් ඇරඹීමට තම දෙමහල් නිවස ත්‍යාග කරන්නෙකී.
iii. අනාථ ළමා නිවසකට මාසිකව මුදල් පරිත්‍යාග කරන්නෙකි
iv. පිහිට විය යුත්තාට ස්වත්‍යාජයෙන් පිහිට වන්නෙකි.

21.දේව පුත්‍රභාවය හා ස්වර්ග රාජ්‍යයේ උරුමය හිමිකර ගැනීමේ භාග්‍ය ලබන්නේ නම්,

i. සාමය ඇති කරන්නෝ හා යුක්තිය උදෙසා පීඩා විදින්නෝය.
ii. සාමය ඇති කරන්නෝ හා යුක්තියට සා පිපාසා ඇත්තෝය
iii. සාමය ඇති කරන්නෝ හා ශෝක වන්නෝය
iv. සාමය ඇති කරන්නෝ හා නිර්මල සිත් ඇත්තෝය.

22. 1 කොරින්ති 13 අනුව කිතුනු බැතිමතුන් ප්‍රීති විය යුතු හා ප්‍රීති නොවිය යුතු අවස්ථාකි.

i. ඉවසිලි වන්තකම හා උඩගුකම ගැනය.
ii. හරි දේ ගැන හා අනුන්ගේ වරද ගැනය
iii. විනීතකම හා කෝපය ගැනය
iv. පරාර්ථකාමීත්වය හා ආත්මාර්ථකාමීත්වය ගැනය.

23. දෙවියන් වහන්සේ පිළිගන්නාවූ සැබෑ බුද්ධිමය නැමදුම වේ.

i. සතිපතා දේව නමස්කාරයට ගොස් පාපොච්චාරණය කිරීමය.
ii. නොකිතුනු ජන කොටස් අතර ආදර්ශමත්ව දිවි ගෙවීම ය.
iii. මැවුම්කාර දෙවිඳුන්ට කීකරුව පක්ෂපාතීව ජීවත්වීමය.
iv. අපගේ ශරීර ප්‍රසන්න වූ ජීවමාන යාගයක් ලෙස දෙවිදුන්ට කැප කිරීම ය.

24. සැබෑ මිදිවැලට ඒකාබද්ධවී ඵල දරන කිතුනු බැතිමතුන්ගේ ජීවිත වලින් එළි දැක්වෙන ලක්ෂණයකි.

i. සාමාජිකත්වය දරණ කිතුනු සභාවේ ක්‍රියාකාරී අවයවයන් වීමය.
ii. අඳුරු ලොවක දීප්තිමත් තාරකා මෙන් ආලෝකය විහිදවා යාම.
iii. වාද භේද අභිබවා අසල් වැසි ප්‍රේමය ක්‍රියාත්මක කිරීමය.
iv. දේව සේවකයන්ගේ අවශ්‍යතා ඉටු කිරීමට වැයවීමය.

25. ශුද්ධාත්ම බලයෙන් පූර්ණ වූ මුල් සභාව විශේෂ අවධානය යොමු කළේ.

i. තම ආර්ථික සැලසුම ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීමටය.
ii. කිස්තු උත්ථානයට නිර්භීතව සාක්ෂි දැරීමටය.
iii. ග්‍රීක බස කථා කළ යුදෙව් වැන්දඹුවන්ට සාධාරණ ලෙස අවශ්‍යතා සැපයීමටය.
iv. රෝගීන් හා පීඩිත වූවන්ට සුව සහනය ලබාදීමටය.

26. පවුල තුල එකමුතුකම රැක ගැනිමට අත්‍යාවශ්‍ය වන්නේ,

i. මාපියන් හා දරුවන් අතර සුහඳ සම්බන්ධතාවය වර්ධනය වීමය.
ii. පවුල තුල දුර්වලයන් , ලාබාලයන් , වයෝවෘද්ධයන් කෙරෙහි දයානුකම්පාවෙන් කටයුතු කිරිමය.
iii. පවුල තුල දූරිය නොහැකි බර අවම කිරීමට දායක වීමය.
iv. ක්‍රිස්තුස් වහන්සේ හා ගැඹුරු සම්බන්ධතාවය තුළ ප්‍රේමයෙන් වැයවීමට කැපවීමය.

27. යේයුස් වහන්සේ තුළ දෙවියන් වහන්සේ වැඩ සිටින බව නිකදේමුස් නිගමනය කර තිබුණේ,

i. යේසුස් වහන්සේ ගුරුවරයෙක් බව දැන සිටි නිසාය .
ii.යේසුස් වහන්සේ හාස්කම් කල නිසාය.
iii. යේසුස් වහන්සේ ජනතාව අතර ජනප්‍රිය වූ නිසාය.
iv. යේසුස් වහන්සේ සමාජයෙන් ප්‍රතික්ෂේප කළ අය පිලිගත් නිසාය.

28. කිතුනු විවාහය තුළ පුරුෂයා හා ස්ත්‍රිය එකිනෙකාට යටත් විට යුත්තේ,

i. දෙදෙනාම ක්‍රිස්තුස් වහන්සේට ඇති ගෞරවය නිසාය,
ii. දෙදෙනාම විවාහ දිනයේ දි වූ පොරොන්දුව නිසාය.
iii. දෙදෙනාම  කිතුනු පවුල් තුල ඇති දුඩි වීම නිසාය.
iv. දෙදෙනාම ශුද්ධ.සභාවට හා සමාජයට ආදර්ශයක් විය යුතු නිසාය.

29. ක්‍රිස්තියානිය ද්වේෂ කළ සාවුල්, දෙවිදුන්ගේ දෑත් තුළ ප්‍රබල ආයුධයක් බවට පත් වූයේ,

i. උත්ථාන වූ ජීවමාන ජේසුස් වහන්සේගේ හඬට කීකරු වීමෙනි.
ii. කිතුනුවන්ට කළ දරුණු පීඩන ගැන තෙදිනක් මනස්ථාපනය වීමෙනි,
iii. ස්තේපන්ගේ ජීවිතයේ අවසානය දෙනෙතින් දර්ශනය කිරීමේනි
iv. උත්තම පූජක අවසරය ඇතිව දමස්කයට යද්දී. සිය කැමැත්තෙන් තීරණය වෙනස් කිරීමෙනි.

30. ජුදෙව් , විජාතික මිශ්‍ර සභාව අවංකව උපවාසයෙන් ශුද්ධාත්ම පිහිට යැදුවේ.

i. නොදමුණ ජනතාවක් සමිදුන්ගේ මාර්ගයට යොමු කිරීමටය.
ii. ක්‍රිස්තු  අණ පරිදි ශුභාරංචි සැලසුමට දායක වීමට ය.
iii. ශුභාරංචියේ ජීවමාන පණිවිඩය අන් අයට පිළිගැන්වීමට තිබූ අධිෂ්ඨානයයි.
iv. මුල් සභාවේ ආදර්ශය අනුව වර්ධනය වීමටය.

31. බර්ණබස් හා පාවුල් අභියෝග හමුවේ හවුල් නායකත්වයෙන් සේවයට ආදර්ශයක් ලබා දුන්නේ ,

i. යුදෙව් ගල් ගැසීමේ කුමන්ත්‍රණය දැනගත්විට මගහැර යාම ය.
ii. ප්‍රාතිහාරයන් මගින් ජනතාව ඇදහීමට යොමු කිරීම ය.
iii. දුඩි විරෝධය හමුවේ නොසැලී ශුභ අස්නට සාක්ෂි දැරීම ය.
iv. දේව වරප්‍රසාද තුළ බොහෝ කලක් නැවති දූතසේවය උදෙසා ඉදිරියට යාම ය.

මින් නිවැරදි පිළිතුරු වන්නේ,

i)  iii හා iv ය.     ii) ii හා iv  ය.     iii) i හා iv ය.     iv) i හා iii  ය.

32. ලුස්ත්‍රාවේ ජනතාව සාවුල් හා බර්ණබස්ට දෙවිවරුන්ගේ නම් දුන්නේ,

i. මව් කුස පටන් කොරව සිටි පුද්ගලයා නැගිට සිටි ආකාරය දුටු නිසාය.
ii. පාවුල් සුවය වෙනුවෙන් මහ හඬින් කී වචන අසා ජනතාව මවිත වූ නිසා ය.
iii. බහු දේව වාදයට ඇබ්බැහි වූවන් දෙවිවරුන්ගේ ආශ්චර්යවත් ක්‍රියා පැතු නිසාය.
iv. මිනිස් වෙසින් පතිත වී දෙවිවරු ක්‍රියා කරන බව ජනතාව පිලිගත් නිසාය.

33. ශුද්ධ ලියවිල්ලෙහි සත්‍ය තා අවබෝධ කරගෙන මුළු සිතින් ධර්ම දූතයන්ගේ ඉගැන්වීම් පිළිගෙන අදහාගත් ජනයා ජීවත් වූයේ.

i. පිලිප්පියේ ය. ii. තෙසලෝනිකයේ ය. iii. බෙරියේ ය. iv. ඇතන්ස්හී ය.

34. "උන්වහන්සේ අප එකිනෙකාට නුදුරුව සිටින සේක". මෙම ප්‍රකාශනය කලේ කුමන අවස්ථාවේදී ද?

i. ඇතැන්ස් නුවර අරියෝපග ශාලාවේ දේශනය කල අවස්ථාවේ

ii. ඇතැන්ස් නුවර වෙළදාම් පොලේදී ජුදෙව්වරු හා වාද කළ අවස්ථාවේදී

iii. ඇතැන්ස් නුවර ස්තොයික හා එපිකුරිය දාර්ශනිකයන් හා කතා බහ කළ අවස්ථාවේදී.

iv. ඇතැන්ස් නුවර ජනතාව "මේ වාචාලයා කුමක් කියන්නට හදනවා දැයි" ප්‍රකාශ කල අවස්ථාවේ.

35. ප්‍රේම පාරමිතාවට අනුව ඉවසීමෙන් ජයග්‍රාහී ඵල නෙලා ගැනීමට හැකි වන්නේ,

i. බොරු චෝදනා හිත් රිදීම් නින්දා අපහසා හා පොරබැදීමෙනි

ii. නිහඬව,යටත්ව, අයුක්තිය හා අසාධාරණය හෙළා දැකීමෙනි ,

iii. අඳුරු ලොවක දීප්තිමත් තාරකා මෙන් සෑම ඉරියව්වකින්ම දේව සබඳතාව පෙන්වීමේනි.

iv. අන්‍යයන්ගේ සුබ සිද්ධිය උදෙසා ආශ්චර්යයන් විදහා පෑමෙනි.

36.අයුත්තිය අසාධාරණය මෙල්ල කිරීමට නියමිත මොහොත විවර වන්නේ,

i. යහපත ඉටුකර අවංකව නීතියට යටත්වීමෙනි,

ii. දුෂ්කර උණත් සියල්ලේදී ප්‍රශංසාවෙන් දේව කැමැත්තට ඉඩදීමෙනි.

iii. දඩු කඳක් වුවද සවිකීරිමේදී අයිතිවාසිකම් වෙනුවෙන් හඬ නැගීමෙනි.

iv. නීතියේ ආරක්ෂකයන් ඉදිරියේ ගොළුවත රැකීමෙනි.

37. පාවුල් තුමා දේශනා කළ, යේසුස් වහන්සේගේ නාමය ගෞරවයට පත්වීමත් සමග සිදුවූයේ ,

i. නපුරු බලවේග ශුභාරංචි පණිඩය අනුමත කිරීමය

ii. නපුරු ආත්ම පරාජිතව අන්ත නිග්‍රහයට පත්වීමය

iii. පාවුලු තුමා පැහැදිලි කළ ගැළවීමේ පණිවිඩයේ සත්‍යතාවය අණාවරණය වීමය.

iv. ව්‍යාජ ව්‍යායාමයට දායක වූයේ, මනස්ථාපනයෙන් යුතුව නව උපතකට පා තැබීමය.

38. අනාගතයේදී, තීරණ ගැනීමට අවස්ථාව එළඹුණු විට කීතුනු දරුවෙකු ලෙස වඩා ඵලදායී වන්නේ,

i. මැවුම්කාරයාණන්ගේ සැලසුම අනුව නිහතමානීව අවනත වීමය .

ii. නිරන්තර යැදුමෙන් තම තීරණය සලකා බැලීමට කන්නලව් කිරීමය.

iii. ක්‍රිස්තු ආදර්ශය මෙනෙහි කරමින් තම ආත්ම විශ්වාසය මත රැඳී සිටීමය.

iv. තිරණ හමුවෙහි තමාට හිමිවන යස අයස තක්සේරු කිරීමය.

39. මිහි මත පිවිත වන්දනා ගමනක යෙදෙන බැතිමතුන් කුණාටු අභියසදී ඒවා,

i. දේව ප්‍රේමයේ ලකුණක් ලෙස පිළිගෙන සන්සුන් විය යුතුවේ.

ii. දේව සබඳතාවය තුළ ඇදහිල්ල සවිමත් කරගත යුතුවේ.

iii. කුණාටුව සංසිඳවීමට යාච්ඤා බලකොටු සමග යැදුම් ඔප්පුකළ යුතුවේ.

iv. සුවය දෙන ශුද්ධාත්මයාණන්ගේ සරණ පතා භාරවිය යුතුවේ.

40. "මම දෙවියන් වහන්සේ විශ්වාස කරමි. මට කී ලෙසට සිද්ධ වන්නේ යැයි විශ්වාස කරමි". මෙම විශ්වාසනීය ප්‍රකාශනය කළ හැක්කේ.

i. එකම දෙවියන් කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත් වන පුද්ගලයන්ටය

ii. සේවයට පූර්ණකාලීනව ඇප කැපවී සිටින සේවකයන්ටය

iii. ඇදහිල්ලේ ප්‍රබල පදනම මත නව ජීවිතයකට උපත ඇත්විදි බැතිමතුන්ටය.

iv. දෙවිඳුන්ට කළ නොහැකි කිසිවක් නැත. ක්‍රියා ප්‍රසිද්ධියේ සාක්ෂි දරනන්ටය.

**

## II. කොටස

- **පළමු ප්‍රශ්ණය අනිවාර්ය වේ. ඉතිරි ප්‍රශ්න වලින් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක්ද, තෝරාගන්නා ලද ඉතිරි ප්‍රශ්ණ සඳහා ලකුණු 10 බැගින්ද හිමිවේ.**

01. i. යුදෙව්වන්ට ගෙවීමට තිබූ බදුවර්ග දෙකක් හා ගෙවිය යුතු කාසි වර්ගය ලියන්න.
ii. "දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔබ අතරය" කියා ජේසුස් වහන්සේ වදාලේ කවුරුන් විමසූ කුමන පැනයකටද?
iii. අන්‍ය ජාතික ශතාධිපතියාගේ ජීවිතයෙන් එළි දැක්වුණ ගුණාංග 2 ක් ලියන්න.
iv. බෙතානියේ සහෝදරියන් දෙදෙනාගෙන් ජේසුස් වහන්සේ ලත් ද්විත්ව සත්කාර කවරේද?
v. ආ) යුදෙව් පාස්කුව නමින් සැමරු මංගල්‍යය කුමක්ද?
ආ) යුදෙව් ජනතාව ඒ මගින් සිහිපත් කලේ කුමන සිද්ධියද?
vi. ලූක් වර්තාවට අනුව ජේසුස් වහන්සේගේ දේව පුත්‍රභාවය අහසින් නික්මුණු හඬකින් ප්‍රකාශිතය. ,ඒ අවස්ථා දෙක ලියන්න.
vii. නැතිවූ රිදී කාසිය පිළිබඳ උපමාවෙන් දේව රාජ්‍ය පිලිබඳව අප ලබන සත්‍යතා 2 ක් ලියන්න.
viii. යේසුස් වහන්සේගේ සේවක නායකත්වය විදහා පෑ අවස්ථාව හා එම ක්‍රියාවලිය ලියන්න.
ix. දස පනතෙහි දෙවියන් වහන්සේ හා සම්බන්ධ ආඥා දෙකක් ලියන්න.
x. යහපත් බැතිමතෙකු වූ බාර්ණබස්ගේ ආත්මික දිවි පැවැත්ම සම්බන්ධ කරුණු දෙකක් ලියන්න.

2. i. ජේසුස් වහන්සේ රාජ තේජසින් ජෙරුසලමට පැමිණි අවස්ථාවේදී සමූහයාගේ හැසිරීම් රටාව හා යුදා නායකයින් කළ යෝජනාව ලියන්න.
ii. "මොවුන් නිහඬ වූවහොත් ගල් මොරගසනු ඇත" මින් ජන නායකයන්ට යේසුස් වහන්සේ සිහිපත් කරන්නේ කුමක්ද?
iii. "මාගේ පියාණන් වහන්සේගේ ගෘහයෙහි මා සිටිය යුතු බව" හා "මාගේ ගෘහය යාච්ඤාවේ ගෘහය" මෙම ප්‍රකාශ දෙකට අනුව දෙව් මැදුර පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

3. i. ජේසුස් වහන්සේ වරදට පත් කිරීමට මාන බලමින් සිටි සද්දූසිවරු , ආගමික දේශපාලනික ක්ෂේත්‍ර එල්ලකළ ප්‍රශ්න දෙක ලියන්න.
ii. සද්දූසිවරු යුදෙව් ව්‍යවස්ථාවේ කතෘත්වය හා අනුමත කළ දෑ කවරේද? ප්‍රතික්ෂේප කළ මතු බලාපොරොත්තුව කුමක්ද?
iii. ජේසුස් වහන්සේ සද්දූසිවරුන් නිහඬ කරමින් පුනර්ජීවනය පිළිබඳ කළ අනාවරණය මඟින් කිතුනු ඔබ ලබා ඇති බලාපොරොත්තුව පේළි 10 කින් ලියන්න.

4. i. මිසරයේදී විවිධ ක්ෂේත්‍රයන්හී වර්ධනය වූ ඉශ්‍රායෙල්වරු වහල් භාවයට ඇද වැටුනේ මන්ද? එම පීඩාව තුල ජනතාව යොමුවූයේ කුමකටද?
ii. පීඩා විඳි ජනතාව අතර ඇති දූඩි වූ ජේසුස් වහන්සේ, එම තත්වයන් වෙනස් කිරීමට යොමු වූ ආකාරය කාන්තාවන් ළදරුවන් විජාතින් ඇසුරින් උදහරණ සහිතව පහදන්න.
iii. ඔබගේ උපන් දිනය, නත්තල /විශිෂ්ට විභාග ප්‍රතිඵල ලැබී සමරණ අවස්ථාවකදී , බඩගින්නෙන් පෙළෙන දුගී පවුලක් කෑම ඉල්ලා ඔබ ලඟට පැමිණිය හොත් , ඔබ ගන්නා ක්‍රියාමාර්ග පේළි 10 කින් ලියන්න.

5. i. යේසුස් වහන්සේ , මධ්‍යහන්‍යයේ සමාරියට පැමිණ කළේ කුමක්ද? ඉන් ගම්‍ය වන්නේ මෙසියස් වහන්සේ ගේ කවර ස්වභාවයක්ද?
ii. ඉහත සිදුවීම තුළින් ජාතිවාදයෙන් පීඩාවිඳින සමාජයකට අනාවරණය කරන සත්‍ය කුමක්ද?
iii. දෙවියන් වහන්සේගේ රාජ්‍යය දැකගත හැකි මාර්ගයකි ජේසුස් වහන්සේ මෙය පැහැදිලි කලේ කටද? එම මාර්ගය කුමක්ද?

6. i. දිවැසිවර ජෝවෙල් පැවසූ අනාවැකිය ඉටු වූයේ ජුදා ආගමේ කුමන සමරුම් දිනකද එදින ක්‍රිස්තු ශ්‍රාවකයින් කුමක යෙදී සිටියේද?
ii. අ) පේදුරු තුමාගේ දේශන ඇසූ ජනතාව අසන ලද ප්‍රශ්නය කුමක්ද?
ආ.) පේදුරුගේ මගපෙන්වීම තුළ සභාවේ සාමාජිකත්වය සිඝ්‍රලෙස වර්ධනය වීමට හේතුව කුමක්ද?
iii.අ.) යේසුස් වහන්සේ ශ්‍රාවයන්ට භාරදුන් සංකේතාත්මක ආදර්ශමත් පිළිවෙත ලියන්න
ආ. එම පිළිවෙත තුලින් මුල් සභාවේ බැතිමතුන්ගේ ජීවිත වල සිදුවූ බැදීම කුමක්ද? එම පිළිවෙත පැවැත්වූයේ කොහේද?
ඇ. වර්තමාන කිතුනු සභාව තුළ පවත්වන මෙම පිළිවෙතට ඔබ සහභාගී වන්නේ මන්ද? සහභාගී විය යුත්තේ කෙසේද?

07. පහත සඳහන් මාතෘකා වලින් දෙකක් තෝරාගෙන පිළිතුරු සපයන්න.
1. පෙරමග දූක සේවය
2. යාච්ඤාව
3. යේසුස් වහන්සේගේ කැප කිරීම
4. මුල් කිතුණු සභාවේ ආරම්භය
5. සහජීවනයෙන් කටයුතු කරමු.

***

**11 ශ්‍රේණිය අනාවරණ පරීක්ෂණය -2023**
**පිළිතුරු පත්‍රය ක්‍රිස්තියානි ධර්මය**

I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | iii | 11. | i | 21. | i | 31. | i |
| 2. | ii | 12. | iv | 22. | ii | 32. | ii |
| 3. | ii | 13. | iv | 23. | iii | 33. | iv |
| 4. | i | 14. | ii | 24. | iii | 34. | i |
| 5. | ii | 15. | ii | 25. | iv | 35. | ii |
| 6. | ii | 16. | i | 26. | ii | 36. | iii |
| 7. | iv | 17. | iii | 27. | iv | 37. | ii |
| 8. | iii | 18. | ii | 28. | iii | 38. | iii |
| 9. | ii | 19. | iii | 29. | ii | 39. | iv |
| 10. | i | 20. | i | 30. | i | 40. | iii |

ii කොටස

1. i. ජාතීන්ගේ පියා / ආබ්‍රම්
ii. පේදුරුතුමා
iii. යේසුස් වහන්සේ ස්නාවට යොහන්ගැන
iv. නැතිවූ අය සොයායෑම
v. දාර්ශනිකයන් පරිවරා ඇසුර / විවිධ ජාතීන්ගේ සිරිත් විරිත් / සාහිත්‍ය තරඟ පිළිබඳ දැනුම/විවිධ භාෂා දැනුම
vi. විශ්වාසනීයත්වය
vii. යේසුස් වහන්සේ /අපි /දෙවියන් වහන්සේ
viii. ස්වාමින් වහන්සේගේ පෝෂණය තුලින්
ix. පොජපාවේදී /කොරානේලියස්ව
v. බලතණ්හාව /ආත්මාර්ථය/තෘෂ්ණාව

2. i. ඉවසීමෙන් සත්‍යවාදීව එඩිතරව ක්‍රියාකිරීම/අන් අයව දිරිමත් කිරීම/ දිවි රැකීමට යොමුවීම
ii. සීතයට ගිනිමැලයක් ගැසීම/දින 3 ක් ආගන්තුග සත්කාරය දැක්වීම/පාවුල් ඇතුළු පිරිස පිටත්ව යන
විට අවශ්‍ය දේ නැවට පැටවීම.
iii. නැවත බලාපොරොත්තු වෙන් තොරව සත්කාර කිරීම නාදුනන අයට සත්කාර කිරීම / අසල්වැසියාට ප්‍රේමකිරීම සිසු අදහස් වලට ලකුණු ලබා දීම.

3. i. රූප විපර්යාසය /අන්වෙසක් වීම
ii. රූප විපර්යාස සිදුවීම කෙටියෙන් විස්තර කළ යුතුයි.
iii. උත්ථාන වූ යේසුන් වහන්සේ අනුගමනය කිරිම
ශුද්ධාත්ම මළ අනුව කටයුතු කිරීම
දේව වචනය නිවැරදිව අවබෝධ කර ගැනීම
සමාජයට යහපත ඉටු කිරීම ආදි කරුණු

4. i. උඩුමහලකට රැස්වීමට /ශුද්ධාත්ම බලය පහල වීම සෑම සුළඟ /ගිනි දිවි බෙදීයාම
ii. ඉගැන්වීම/රොටි කැසීම /සහභාගීකම/යාච්ඡාව පොදුවේ තබා ගැනීම
iii. ඉගැන්වීම - දේව වචනය
සහභාගී කම - ශුද්ධ සහභාගී කම
යාච්ඥාව - රෝගීන් උදෙසා වැනි අදහස්

5. i. සමාරියාව /ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයකි
ii. දුප්පතා සල්ලි වලටද, ද්‍රෝහියා සෙරෙප්පු දෙකකට වටිනාකමටද වඩා වැඩි නොවන බව
iii. සිසු අදහස් වලට ලකුණු දෙන්න.

6. i. සවභාවික/මිනාසා සිදුකරන
ii. අසාධාරණ /ප්‍රචන්ඩත්වය /හිංසනය
iii. සිසු අදහස් වලට

7. i. යාච්ඤාව - කිතුනුවන් සතු ප්‍රබල අවියක් /දෙවියන් වහන්සේ හා සම්බන්ධතා පවත්වා ගන්නා සන්නිවේදන මධ්‍යස්ථානයක්
ii. කිතුනු බෞතිස්මය - දේව අනුහයට බාරවීම/උන්වහන්සේ ගේ දරුවෙකු ලෙස පෞද්ගලික ගැලවුම්කරු ලෙසට බාර වීමයි/සභා සම්ප්‍රදායක්

iii. ප්‍රේම පාරමිතාව - සිසු අදහස්
iv. සිසු අදහස්
v. සිසු අදහස්


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න